**යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය) - 2019**

---------------------------------------------------------------------------------------------------------------

යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ (අතිරේක මූල්‍යනය) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 දෙසැම්බර් 15 දින එළඹි අංක 3603 - එස්ආර්අයි සහ අංක 3604 - එස්ආර්අයි ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක මුල් ව්‍යාපෘතියේ ප්‍රතිව්‍යුහගතකරණයට උපකාර කිරීම තුළින් ඉලක්කගත නාගරික හා උප නාගරික ප්‍රදේශවල ජනතාවගේ ආරක්ෂිත පානීය ජල ප්‍රවේශ අවස්ථා වැඩි දියුණු කිරීම හා යාපනය අර්ධද්වීපයේ ජල සම්පත් ආරක්ෂා කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 23,256 කට සමාන එජඩො මිලියන 153 ක් විය. ඉන් රු.මිලියන 18,240 කට සමාන එජඩො මිලියන 120 ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 5,016 කට සමාන එජඩො මිලියන 33 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 දෙසැම්බර් 15 දින ආරම්භ කරන ලද අතර 2025 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.1 ගිණුම්කරණ අඩුපාඩුව**

| ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින දක්වා ණය නියෝජිතායතනය විසින් අයකර ගන්නා ලද රු.මිලියන 1.33 ක් වූ පොළී හා රු.මිලියන 44.68 ක් වූ බැඳීම් ගාස්තු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල උපයෝජනයන් අව ප්‍රමාණය වී දැක්වේ. | ඒඩීබී හි මූල්‍යනය සඳහා වන බැඳීම් හා පොළී ගාස්තු 2019 වර්ෂයේ වියදම් ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පොත්වල ගිණුම්ගත කර වාර්තා කරන බැවින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල එම බැඳීම් හා පොළී ගාස්තු වියදම් ලෙස ගිණුම්ගත කර නැත. | සමාලෝචිත වර්ෂයේ සමස්ථ උපයෝජනය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| මුහුදු ජලය ප්‍රතිවර්තිය අවශෝෂණ පිරියත ඉදි කිරීමේ කොන්ත්‍රාත්කරු හා යාපනය නගර ප්‍රදේශයේ බෙදා හැරීමේ ජාලයේ නල සැපයීම් හා එළීමේ කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමට පිළිවෙළින් වර්ෂ 3 ක් හා වර්ෂය බැගින් ගත වී තිබුණ ද, 2020 ඔක්තෝම්බර් වන තුරුත් එයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි. තවද, 2006 ප්‍රසම්පාදන අත්පොතෙහි ඡේද 4.2.3ට අදාල අංක 31 දරන අතිරේකය | ව්‍යාපෘතියේ කාර්යයන් සම්පූර්ණ කිරීම ප්‍රමාද වීම. | මුහුදු ජලය ප්‍රතිවර්තිය අවශෝෂණ කිරීමේ පිරියත ඉදි කිරීමේ ටෙන්ඩරය 2016 දෙසැම්බර් 07 දින කැඳ වූ අතර 2017 ජූලි 17 දින අවසන් කරන ලදි. තාක්ෂණික ටෙන්ඩරය 2017 ජූලි 17 දිනත් මූල්‍ය ටෙන්ඩරය 2018 ජූලි 30 දිනත් විවෘත කරන ලදී. කෙසේ වුවද, 2020 අගෝස්තු 31 දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ ටෙන්ඩර්කරුවන්ගේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ පැහැදිලි කිරීම් සඳහා දින 89 ක්, උපදේශන සභය හා සමාලෝචනය සඳහා දින 41ක්, තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඇගයීම් සඳහා දින 151ක්, අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ තීරණය සඳහා දින 379ක්, ආසියානු සංවර්ධන බැංකුවේ | චක්‍රලේඛයේ උපදෙස්වලට අනුගත විය යුතුය. |

අනුව පූර්ව සුදුසුකම් සහිත තරඟකාරී ලංසු කැඳවීම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සති 17 ක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය.

අදහස් දැක්වීම් හා එකඟතාවයන් සඳහා දින 181 ක්, අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම සඳහා දින 201 ක් සහ අභියාචන ක්‍රියාවලිය සඳහා දින 99 ක් ගත වන ලදී. යාපනය නගර සහා ප්‍රදේශයේ බෙදා හැරීමේ පද්ධතිය සඳහා නල සැපයීම් හා එළීම සඳහා වන කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල සංදේශය 2020 ජුනි 15 දින ඉදිරිපත් කරන ලදි. ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ කාර්යයන්වල භෞතික ප්‍රගතිය**

| කාර්යය | 2019 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත කාර්යය සාධනය | සත්‍ය කාර්යය සාධනය | | | |
| මුහුදු ජලය ප්‍රතිවර්ත්‍ය අවශෝෂණ පිරියත ඉදි කිරීම | කොන්ත්‍රාත්තුව 2021ඔක්තෝම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර ඇත. | 2020 නොවැම්බර් 30 වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නැත. | යාපනය අර්ධද්වීපයට ආරක්ෂිත පානීය ජලය සැපයීම ප්‍රමාද වේ. | සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව, මුහුදු ජලය ප්‍රතිවර්ත්‍ය අවශෝෂණය පිරියත 2020 වර්ෂය අවසානයේ ප්‍රදානය කිරීමට ව්‍යාපෘතිය හා අදාල අධිකාරීන් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත. | සැලසුම් කළ පරිදි කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා ණය මුදලින් රු.මිලියන 18,240කට සමාන එ.ජ.ඩො මිලියන 120 ක් වෙන් කර තිබුණ ද ව්‍යාපෘතියේ මන්දගාමී භෞතික ප්‍රගතිය නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 175.16කට සමාන එජඩො මිලියන 0.97ක් පමණක් උපයෝජනය කර තිබුණි. මන්දගාමී අරමුදල් උපයෝජනයේ ප්‍රතිඵලයක් ලෙස, ණය නියෝජිතායතනය විසින් 2019 දෙසැම්බර් 31 දින දක්වා බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 44.68 ක් අය කර තිබුණි. | ශ්‍රී ලංකා රජයට අතිරේක පිරිවැයක් දැරීමට සිදු විය හැක. | ව්‍යාපෘති කළමනාකරණ අත්පොත (PAM) අනුව අතිරේක මූල්‍යනය යටතේ පහත කොන්ත්‍රාත් පැකේජ අඩංගු වී තිබුණි.<br><br>1. මුහුදු ජලය ප්‍රතිවර්තිතා අවශෝෂණ පිරියත සංරචකය<br>2. යාපනය නගර සභාවේ බෙදා හැරීමේ පද්ධතිය<br>3. ජල කුළුණු සහ බෙදා හැරීමේ පද්ධති 02<br>4. බෙදාහැරීමේ පද්ධතිය (2 අතිරේක)<br><br>බෙදා හැරීමේ පද්ධති 02 පැකේජය (ඩීඑන් 02) 2018 ඔක්තෝම්බර් 29 දින ප්‍රදානය කර තිබූ අතර ඉදිකිරීම් කටයුතු කෙරෙමින් පවතී. අතිරේක මූල්‍යනය යටතේ මෙහි සැලකිය යුතු මූල්‍ය ප්‍රගතියක් පෙන්වයි.<br>යාපනය නගර සභාවේ බෙදාහැරීමේ පද්ධතියට අයත් යාපනය නගර ප්‍රදේශය තුළ බෙදාහැරීමේ නල සැපයීම හා එළීමේ කොන්ත්‍රාත්තුවේ කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල සංදේශය 2020 ජුනි 15 දින ඉදිරිපත් කරන ලදී. ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.<br>අතිරේක මූල්‍යනයේ ප්‍රධාන සංරචකය වන මුහුදු ජලය ප්‍රතිවර්තිතා අවශෝෂණ පිරියත සඳහා වැඩි කොටසක් වෙන් කර ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසා මුහුදු ජලය ප්‍රතිවර්තිතා අවශෝෂණය පිරියත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නැත.<br>මෙහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය බලාපොරොත්තු වූ මූල්‍ය ප්‍රගතිය 2019 දෙසැම්බර් 31 දින දක්වාත් ළඟා කර ගත නොහැකි විය. මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ පසු, 2020 වර්ෂයේදී සැලකිය යුතු මූල්‍ය හා භෞතික ප්‍රගතියක් අත්කර ගත හැකි බව කාරුණිකව අවධාරණය කරමි. | බැඳීම් ගාස්තු අඩු කර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඒඩීබී සමග සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. |